# මාර්ගගත ක්‍රමය මගින් සේවා ඉටුකිරීම

**ඛනිජ හා පාෂණ නිස්සාරණය සඳහා නිර්දේශ ලබාදීම**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන, ඛනිජ හා පාෂණ නිස්සාරණය සඳහා වන නිර්දේශ, ලබා ගැනීම පිණිස ඉදිරිපත් කල යුතු අයදුම්පත්, පහතින් දක්වා ඇති දිගුව මගින් බාගත කර ගත හැකිය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් කර ඇති අංක 1 සිට 8 දක්වා සඳහන් කොට ඇති සියළුම ලේඛණ ද සමඟ අදාල පළාතේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය වෙත විද්‍යුත් ලිපිනය මගින් / තැපෑලෙන් එවීමට කටයුතු කල යුතුවේ. අදාල පළාත් වල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයන් හි විස්තර ද පහත සඳහන් කර ඇත.

1. ඉඩම් හිමි ආයතනයෙන් හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමේ ලිපිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ග.ලේ. 22 ආකෘතිය යටතේ ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම.
2. අදාල ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන ඉඩමේ ඔප්පුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි ඔප්පුවක් විය යුතු අතර ඉඩමේ අයිතිකරු නොවන අවස්ථාවල ඉල්ලුම්කරු විසින් අයිතිකරුගෙන් බදු ගිවිසුමක් මගින් ඉඩම පවරා ගත් බදු ඔප්පුවේ ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම.
3. ඛනිජ හා පාෂාණ ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලබන හෝ පවත්වාගෙන යාමට අදහස් කරනු ලබන ඉඩමේ ඔප්පු අංකය, පිඹුරු අංකය, බිම් කට්ටි අංකය හා ඉඩම් ප්‍රමාණය ඉතා පැහැදිලිව බදු ගිවිසුමේ සඳහන් කිරීම.
4. අදාල ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන ඉඩමේ භූමි කොටස වෙන්කර අඳින ලද මිනින්දෝරු හෝ බලයලත් මිනින්දෝරු පිඹුරු පතක් ඉදිරිපත් කිරීම.
5. අනන්‍යතාවය තහවුරු කලහැකි පිළිගත් ලේඛනයක පිටපතක් ඉදිරිපත් කිරීම.
6. අදාල ව්‍යාපෘතිය සිදුකරනු ඉඩමට වරිපනම් ගෙවන්නේනම් එම ලේඛණයේ පිටපතක් හෝ වරිපනම් නොගෙවන්නේනම් නොගෙවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.
7. ඉහත සඳහන් මුල් ලේඛණවලින් ලබාගත් ඡායා පිටපත් ව්‍යාපෘතිය සිදුකරනු ලබන කොට්ඨාසභාර ග්‍රාම නිලධාරී මගින් සහතිකකර එම පිටපත් ඉදිරිපත් කිරීම.
8. ස්ථාන පරික්ෂා කිරීමේ ගාස්තු වශයෙන් රු.10000.00 මුදලක් කොළඹ, තිඹිරිගස්යාය පිහිටි මහජන බැංකුවේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ නමට ඇති අංක 086100169026207 දරණ ගිණුමෙහි තැම්පත් කොට ලබාගන්නා ලද රිසිට් පතෙහි පිටපතක් ඉදිරිපත් කිරීම.
9. අංක 1 සිට 8 දක්වා සඳහන් කොට ඇති සියළුම ලේඛණ අදාල පළාතේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය වෙත විද්‍යුත් ලිපිනය මගින් / තැපෑලෙන් එවීමට කටයුතු කිරීම.
10. ඉහත සඳහන් නිවැරදි ලේඛණ ලැබී දින 14 ක් ඇතුලත ස්ථාන පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ක්ෂේත්‍ර පරීක්ෂාවට පැමිණෙන නිලධාරීන් හට මුල් ලේඛණ ඉදිරිපත් කිරීම.
11. ඉල්ලීම් කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරන බවට අනාවරණය වුවහොත් අදාල ඉල්ලීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

ගලේ 22 ආකෘතිය, දිවුරුම් ප්‍රකාශයේ ආකෘති පත්‍රය හා ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයන් හි විස්තර පහත දක්වා ඇත.

|  | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | දුරකථන අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| 1 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, ECC හන්දිය, අම්පාර | 063-2222017 | archaeology.ampara@gmail.com |
| 2 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, ජයශ්‍රී මහ බෝධි මාවත, අනුරාධපුර | 0252222411 | archncp@gmail.com |
| 3 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, සීතාවක, අවිස්සාවේල්ල | 036-2232674 | archkegalle@gmail.com |
| 4 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, 14, පුස්තකාල මාවත, බදුල්ල | 055-2222637 | badullaarchaeology@gmail.com |
| 5 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, අනගාරික ධර්මපාල මාවත, මහනුවර | 081-2222336 | archaeokandy@gmail.com |
| 6 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, නව පරිපාලන සංකීර්ණය, හම්බන්තොට | 0472256688 | a.hamdivision@gmail.com |
| 7 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය- කොටුව, ගාල්ල | 091-2234071 | arch.regional@yahoo.com |
| 8 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ | 011-2667377 | arch.western@gmail.com |
| 9 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, 122, රාසවිත්තෝට්ටම් පාර, නල්ලූර්, යාපනය | 021-2224574 | northarchaeology@gmail.com |
| 10 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, මාළිගා පරිශ්‍රය, කුරුණෑගල | 037-2220475 | paduwasnuwara.arch@gmail.com |
| 11 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, පැරණි කච්චේරි සංකීර්ණය, මොනරාගල | 055-2277738 | archmonaragala@gmail.com |
| 12 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, බැඳිවැව, ජයන්තිපුර, පොළොන්නරුව | 027-2050448 | polonnaruwa.arch@gmail.com |
| 13 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, රත්නපුර | 045-2233737 | archaeologyrp@gmail.com |
| 14 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, සමුද්‍ර ඉතිහාස හා නාවික කෞතුකාගාරය, ත්‍රිකුණාමලය | 026-2221530 | archaeologytrinco@gmail.com |
| 15 | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, පුරාවිද්‍යා කාර්යාලය, වවුනියාව | 027-2224805 | archvavu@gmail.com |

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### ඛණිජ හා පාෂාණ නිස්සාරණය සඳහා නිර්දේශ ලබා ගැනීමේ අයදුම්පත්‍රය

01 ස්ථානයේ නම -

..............................................................................................................................

02 ගම -

..............................................................................................................................

03 ග්‍රාම නිලධාරි වසම හා අංකය හෝ වෙනත් -

..................................................................................

04 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හෝ වෙනත් -

.............................................................................

05 දිස්ත්‍රික්කය -

..............................................................................................................................

06 අයදුම්කරුගේ නම -

..............................................................................................................................

07 ස්ථිර ලිපිනය -

..............................................................................................................................

08 දුරකථන අංකය -

..............................................................................................................................

09 ජාතික හැඳුනුම්පත් අංකය -

..............................................................................................................

10 භූමියේ අයිතිය - පුද්ගලික ☐ රජයේ ☐

11 ව්‍යාපෘතියේ ස්වාභාවය - ගල් කැඩීම ☐ බොරළු/පස් කැපීම ☐ වැලි කැණීම ☐

වෙනත්-....................................................................................................................

12 භූගත හෑරීමක්ද පොළොව මතුපිටද යන්න-

..................................................................................

13 කැඩීමට /කැණීමට යෝජිත බිමේ ප්‍රමාණය- අක්කර ............ රූඩ් ............... පර්චස් ..............

14 මායිම් -

උතුරට..............................................................................................................................

දකුණට..............................................................................................................................

නැගෙනහිරට...........................................................................................................................

බටහිරට...................................................................................................................................

15 අදාළ ස්ථානයට ආසන්න නගරයේ සිට දුර හා ගමන් මාර්ගය පිළිබඳ විස්තර -

.................................................................................................................. ............................

..........................................................................................................................................

..........................................................................................................................................

.................................................................................................. ..............................................

(දළ සටහනක් අමුණන්න)

16 ව්‍යාපෘතියේ කාලය - .................................... දින සිට ............................. .......දින දක්වා

17 ආසන්න භූමි පරිභෝජනය ඇතුළු වෙනත් විස්තර -

..........................................................................................................................................

..........................................................................................................................................

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි වන බව ප්‍රකාශ කරන අතර, මෙහි තොරතුරු සාවද්‍ය බව ඔප්පු වුවහොත් එය මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට හේතු විය හැකි බව මා හොඳාකාරව දනිමි.

එසේම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියකුට මෙම සංවර්ධන ව්‍යාපෘතිය කිරීම සඳහා බලපෑමක් වාචිකව හෝ නොකළ යුතු බව හා ඒ සඳහා ත්‍යාගයක්, ප්‍රදානයක්, සන්තෝශමක්, අල්ලස් මුදලක් හෝ වෙනත් ආකාරයකින් ලබා නොදිය යුතු බව මා හොඳාකාරව දන්නා බවත් එසේ කිරීමක් හෙළිදරව් වුවහොත් 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිසන් සභා පනතේ ප්‍රතිපාදන යටතේ මට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බවත් මා හොඳාකාරව දනිමි.

ව්‍යාපෘති යෝජකයාගේ නම - ..........................................................................................

අත්සන -..................................          දිනය-.........................................

**සැළකිය යුතුය -**

මෙම සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර හෝ ආරම්භ කිරීමෙන් පසුව පුරාවිද්‍යා දෙපාරත්මේන්තුවේ නිලධාරියකු හෝ සේවකයකු විසින් යම් ත්‍යාගයක් , ප්‍රදානයක්, සන්තෝශමක්, අල්ලස් මුදලක් හෝ වෙනත් යම් ආකාරයකින් බාධා කිරීමක් සිදු කරනවානම් ඒ බව වහාම ලිඛිතව හෝ වාචිකව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් හෝ අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිසන් සභාව දැනුවත් කළ යුතුය.

ඇමිණිය යුතු ලේඛන

-  ඉඩමේ අයිතිය සනාථ කරන ලේඛන.
-  යෝජිත භූමියේ වට මායිම් පැහැදිලිව සළකුණු කරන ලද මිනින්දෝරු සැලැස්ම.
-  ජාතික හැඳුනුම්පත ,විදේශ ගමන් බල පත්‍රය හෝ රියදුරු බල පත්‍රය මගින් ඉල්ලුම්කරු සිය අනන්‍යතාවය සනාථ කළ යුතු අතර එහි සහතික කරන ලද මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්

- මීට පෙර ඉල්ලුම් කරනු ලබන ස්ථානයට නිර්දේශ නිකුත් කර තිබුනේ නම් එම ලිපියේ පිටපතක්

*සැ.යු- ස්ථානය පරික්ෂා කිරීමෙන් අනතුරුව නිරවුල් සහතිකය නිකුත් කිරීමට ගත වන කාලය සති තුනකි.*

**<u>දිවුරුම් ප්‍රකාශයයි</u>**

.............................................................................. ........................ (ලිපිනය) පදිංචි ..............................
.............................. ..................................................... ............................... ..............................
(නම) වන මම බෞද්ධාගමිකයකු වශයෙන් සත්‍ය ලෙසද අවංක ලෙසද ගරු ගාම්භීරතා පූර්වකවද පහත සඳහන් ලෙස ප්‍රකාශකර සිටිමි.

- ඉහත නම් සඳහන් ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.
- (ඔප්පු අංක, පිඹුරු අංක, ඔප්පුවෙහි පිඹුරෙහි විස්තර, කැබලි අංකය, බිම් ප්‍රමාණය) සහිත දේපලෙහි නීත්‍යානුකූල හිමිකරු මම වෙමි.
- එකී දේපල සඳහා මා දැනට වරිපනම් ගෙවීමක් නොකරන බව ප්‍රකාශකර සිටිමි.
- එසේම ඉහත සඳහන් කළ කරුණු සියල්ල සත්‍ය බවත් යම් හෙයකින් මා විසින් අසත්‍ය කරුණු ප්‍රකාශකර ඇති බවට ඔප්පු වුවහොත් ඛනිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර නිර්දේශයන් පූර්ව දැනුම්දීමකින් තොරව අහෝසි වන බව මා හොඳාකාරවම දන්නා බවටත් වැඩිදුරටත් දිවුරා ප්‍රකාශකර සිටිමි.

| |
|---|
| මුද්දරය<br>රු.50/= |

ඉහත සඳහන් ප්‍රතිඥා ප්‍රකාශය මා විසින් ප්‍රතිඥා ප්‍රකාශකට කියවා තේරුම්කර දීමෙන් අනතුරුව එහි සඳහන් කරුණු සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා දී වර්ෂ ......................... ............ ක් වූ ...... ............මස .... ........දින දී මා ඉදිරිපිටදී .................................................... .......................... (ස්ථානය) අත්සන් තබන ලදී.

....................................................

දිවුරුම් කොමසාරිස්